හැටන් - දික්ඔය නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගාමිණීපුර ළමා උද්‍යානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.291,394 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසට ගිණුම්ගත කළ යුතු රු.22,500 ක සහ සමුච්චිත අරමුදලට බැරකළ යුතු රු.458,356 ක මුදලක් ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙසට දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුවට සෘජුව ලැබී තිබුණු රු.112,121 ක මුදලක් සහ රු.3,177 | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ක බැංකු ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි. | | |
| (iv) | ජ'නල් සටහන් 33 මගින් වර්ෂය තුළ ලද වට්ටම්, වර්ෂයේ ආදායමට බැර කරනු වෙනුවට ගබඩා තොග ගිණුම බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | පසුගිය වර්ෂයේ කපාහරින ලද රු.506,575 ක සැපයුම් ණයහිමියන් සඳහා සමාලෝචිත වර්ෂයේ මුදල් ගෙවීමේදී සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට ජ'නල් සටහන් 31 මගින් ගබඩා තොග ගිණුම හරකර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ ඇතිවී තිබූ රු.2,202,806 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vii) | දේශිය ණය සහ සංවර්ධන අරමුදල් ශේෂ සනාථ කිරීම් අනුව ණය ශේෂය රු.9,582,260 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 07 සිට වසර 29 දක්වා කාල පරාසයක් ගතවී ඇති ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.13,135,912 ක් අයකර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 සිට වසර 08 දක්වා කාල පරාසයක් ගතවී ඇති රු.173,448 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.4,588,572 ක වටිනා ගිණුම් විෂයයන් 04 කට අදාළ උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | වටිනාකම් සහිත උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කිරීම. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති ,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, | | | |
| 571 | වසර 02 ක් රු.242,543 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,374,088 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,902,395 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාව විසින් ලංකා බැංකුවේ හැටන් ශාඛාවේ පවත්වාගෙන යන අංක 20683332 දරණ ජංගම ගිණුමේ 2019 වර්ෂය මුළුල්ලේම රු.43,000,000 කට අධික මුදලක් ශේෂව තිබුණි. මෙම මුදල ආයෝජනය කිරීම කෙරෙහි සලකා බලා නොතිබුණි. | ඉදිරියේදී සුදුසු පරිදි ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාවට සන අපද්‍රව්‍ය කළමනාකරණයට ඉඩමක් ලද විගස මිලදී ගැනීම සඳහා මෙම මුදල් රඳවා තබාගෙන ඇත. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,100,000 | 18,225,184 | 16,569,609 | 9,154,702 | 17,250,000 | 18,023,950 | 15,554,625 | 7,499,127 |
| කුලී | 19,945,000 | 12,161,450 | 14,225,088 | 1,877,390 | 18,540,000 | 14,277,670 | 12,034,313 | 6,721,223 |
| බලපත්‍ර ගාස්තු | 4,650,000 | 784,505 | 784,505 | - | 18,880,000 | 867,816 | 870,816 | - |
| වෙනත් ආදායම් | 63,201,500 | 1,229,230 | 1,229,230 | - | 12,955,000 | - | 5,143,499 | - |
| | 105,896,500 | 32,400,369 | 32,808,432 | 11,032,092 | 67,625,000 | 33,169,436 | 33,603,253 | 14,220,350 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.7,499,127 ක් වූ වරිපනම් බදු හිඟයෙන් වර්ෂය තුළ රු.4,054,088 ක් පමණක් අයකර තිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු කඩ කාමර 426 ක් වසර 14 කින් පසු තක්සේරු කර නොතිබුණු අතර දැනට මෙම කඩ කාමරවලින් රු.100 – 2800 අතර කුලී අයකරමින් පැවතුණි. | වසර 5 න් 5 ට තක්සේරු කර අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ කඩ කාමර සඳහා නව තක්සේරු කිරීමට අදාළ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කර ඇත. |
| (ඇ) | සතියකට රු.110,000 ක මුදලකට බදු දී තිබූ හැටන් බස් නැවතුම්පළ පොදු වැසිකිළිය සඳහා 2019 දෙසැම්බර් 31 දිනට රු.512,015 ක මුදලක් හිඟව පැවතුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | දික්ඔය පොදු වෙළඳපල අංක 390 A එළු මස් කඩයෙන් දෙසැම්බර් 31 දිනට රු.156,932 ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.1,860,977 ක් හා මුද්දර ගාස්තු රු.11,518,340 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.3.4 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව, ම විසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාරවලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.7,924 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර මුදල් අය කර ගැනිමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා අඥාපනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 03 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) අතහැර දැමූ කර්තව්‍යයන්

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් හැටන් නගරයේ ජීව වායු ඒකකයක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,964,375 ක මුදලක් වැයකර තිබුණි. 2015 වර්ෂයේදී මෙම ඉදිකිරීම සිදුකර තිබුණ ද ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම නිසා අතහැර දමා තිබුණි. | ජීව වායු පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | කසළ කළමනාකරණයට අදාළ සුදුසු ඉඩම් නොමැති නිසා මෙම ඉඩමේ නොදිරන කසළ ගබඩා කර ඇති අතර ඉදිරියේදී කසළ ඉවත් කර නැවත ජීව වායු පද්ධතිය සක්‍රීය කිරීමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව තිරසර සංවර්ධන යෝජනා වෙනුවෙන් 2019 වර්ෂය සඳහා අනුමත කර තිබුණු අයවැය ලේඛනයේ මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා ප්‍රමාණවත් වැඩසටහන් ද ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇති හැටන් තානායම වෙනුවෙන් 2018 සහ 2019 වර්ෂවලට අදාළව අයවිය යුතු රු.1,581,710 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලිඛිතව දැනුම් දී ඇත. |
| (ආ) | 2005 වර්ෂයේදී ඉදිකර පවත්වාගෙන යන ලද දික්ඔය ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කටයුතු නවත්වා දමා ග්‍රාම නිලධාරි කාර්යාලයක් පවත්වාගෙන යාමට ඉඩහැර තිබුණි. | සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වේ. | දික්ඔය ආයුර්වේදය ඉදිරියේදී සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 17ක නිළධාරී පුරප්පාඩු 68 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | පුස්තකාලාධිපති තනතුර වසර 1 ½ ක පමණ සිට පුරප්පාඩු වී පවතින අතර පුස්තකාල සහයක III නිළධාරිනියක් විසින් වැඩ ආවරණය කරමින් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සහා ඉඩම් දීර්ඝකාලීනව බදු දීමේදී අවස්ථා 84 කට අදාළව නගර සභා ආඥා පනතේ 36(ඉ)(II) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමහර බදු ඉඩම්වලට අදාළ පැවරුම් නියෝග සහ අනෙකුත් අවශ්‍ය ලියවිලි සභාවේ නොමැති අතර එම ලියවිලි ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිෂ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන 04 ක් සහ යන්ත්‍රෝපකරණ 10 ක් වසර 1 ½ සිට වසර 23 ක දක්වා කාලයක් භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර අලුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | මහින්ද්‍රා කැබ් රථය අළුත්වැඩියා කිරීමට තීරණය කර ඇති අතර සෙසු වාහන හා උපකරණ ඉදිරියේදි ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවට අයත් දික්ඔය නගරයේ පිහිටි M.A.S අබුසාලි ශාලාව හා එහි පවතින උපකරණ වර්ෂය පුරාම ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව තිබුණි. | ශාලාව හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | දික්ඔය පුස්තකාලයේ පරිග්‍රහන ලේඛනය අනුව පොත් 3000 ක් පමණ තිබුණ ද පොත් බැහැර දීම සිදුව නොතිබුණි. | පාඨකයින් ලියාපදිංචි කිරීම සහ පොත් බැහැර දීම ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | "ඊ - නැණ පියස" මධ්‍යස්ථානයේ කටයුතු නවතා දමා තිබීම නිසා පැවති උපකරණ ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | කටයුතු ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | පුහුණු ගුරුවරයෙකු නොමැති බැවින් මෙම ඒකකය අඩාලවී ඇත. අළුතින් සම්පත් දායකයෙකු මේ වනවිට ඉදිරිපත්වී ඇති අතර ඉදිරියේදී පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. |

3.5.2 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගබඩාවේ පරිහරණයට නුසුදුසු භාණ්ඩ විශාල ප්‍රමාණයක් විනාශ කිරීමට හා වෙන්දේසි කළහැකි භාණ්ඩ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඌනතාව සම්බන්ධව කටයුතු කළ යුතු වේ | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වර්ග 38 ක ඒකක 206 ක ඌනතාවක් අනාවරණය වී තිබූ අතර ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඌනතාව සම්බන්ධව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අණාවරණය වී තිබූ විවිධ වර්ගයේ උපකරණ/ අයිතම 09 කට අදාළව ඒකක 439 ක ඌනතාවයන් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ඌනතාව සම්බන්ධව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.5.3 වාහන උපයෝජනය

-----------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | ------------------------------ |
| (අ) | සභාව සතු වාහන 14 කට අදාළව 2017, 2018 සහ 2019 වර්ෂ වෙනුවෙන් දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම වාහනවලට 2019 වර්ෂයේදී ඉන්ධන වියදම් වශයෙන් රු.4,407,443 ක් සහ අලුත්වැඩියාවන් වෙනුවෙන් රු.885,614 ක් දරා තිබුණි. | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | නගර සභාවට අයත් වාහන 06 ක පැය මීටර/ මයිලෝ මීටර් ක්‍රියා විරහිතව පවතින අතර ඒවා යථාතත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මයිලෝමීටර් යථා තතත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |